# ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්

## පුරප්පාඩු

## ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

## කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩය 2 (MA -2-1-2016) (පිරිමි)

**අධ්‍යාපන සුදුසුකම් - (බාහිර අයදුම්කරුවන්)**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුලුව විෂයන් 04කට සම්මාන සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ,

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී, විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

**තාක්ෂණික නිපුණතා /ප්‍රවීණතා**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

**තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු ඩිප්ලෝමාවක් හෝ ඊට සමාන සුදුසුකම් සහ වසර 01 ක රජයේ පිළිගත් වාණිජ ආයතනයක නිෂ්පාදන හෝ ඉංජිනේරු අංශයේ පළපුරුද්ද.

**ආරම්භක වැටුප් පරිමාණය**

2016.01.01.දින සිට MA2-1 -2016 - රු. 30,310 /= මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ. (2025 අප්‍රියෙල් මස සිට නව අයවැය අනුව වැටුප් සංශෝධනය කරනු ඇත.)

## කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන (MA-1-1-2016)

1. **අධ්‍යාපන සුදුසුකම් - (බාහිර අයදුම්කරුවන්)**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල /දෙමළ
ii. ගණිතය
iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුලුව විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම

**(ඇ) තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම් :**

පරිගණක වදන් සැකසුම, යතුරු ලියනය පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවයන් ලබා තිබිය යුතුය.

**(ඈ) ආරම්භක වැටුප් පරිමාණය :**

2016.01.01.දින සිට MA1-1 -2016 - රු 27,910 /= මීට අමතරව රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ. (2025 අප්‍රියෙල් මස සිට නව අයවැය අනුව වැටුප් සංශෝධනය කරනු ඇත.)

**වෙනත් : සෑම අයදුම්කරුවෙකුම**

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iv. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය 10%ක් දැරිය යුතු අතර, සමාගම විසින් ඒ සඳහා 15%ක් දරනු ලැබේ. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායකත්වයක් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම මඟින් දරනු ලැබේ.
v. වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතුය.
vi. රාත්‍රී වැඩමුර ක්‍රියාත්මක වේ.

අයදුම්පත් තමා විසින්ම සකස් කොට සියලු තොරතුරු හා සුදුසුකම් ඇතුලත් කර කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුරේ නම පැහැදිලිව සඳහන් කර අදාළ අයදුම්පත් 2025.03.17 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ලිපිනය : ජ්‍යෙෂ්ඨ කළමනාකරු, (මානව සම්පත් හා නීති)**
**ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ්,**
**තැ.පෙ, 17, කපුවත්ත, ජා-ඇල.**